2016 අංක 16 දරන තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ පනත යටතේ තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ කොමිෂන් සභාව විසින් ජාතික ළමා ආරක්ෂක අධිකාරිය වෙත කරන ලද නියෝගය පරිදිය.

<u>දිවයිනේ මහාධිකරණයන්හි පවතින ළමා අපයෝජන හා සම්බන්ධ නීතිකෘත්‍ය තොරතුරු ප්‍රදර්ශනය</u>

දිවයිනේ එක් එක් මහාධිකරණයේ පවතින ළමා අපයෝජන හා සම්බන්ධ නීතිකෘත්‍ය පිළිබඳවත් අදාල මාසයේ එම මහාධිකරණයේ විභාගය වීමට / කැඳවීමට නියමිත ළමා අපයෝජන හා සම්බන්ධ නීතිකෘත්‍ය පිළිබඳවත් තොරතුරු මහජනයාගේ දැනගැනීම සඳහා මෙහි ප්‍රදර්ශනය කෙරේ.

1998 අංක 28 දරන අපරාධ නඩු විධාන සංග්‍රහය (සංශෝධන ) පහත නිර්වචනය කරන පරිදි දණ්ඩ නීති සංග්‍රහයේ ,

- 286අ - ළමයින්ට අදාලව කරනු ලබන අසභ්‍ය පළකිරීම්, ප්‍රදර්ශනය
- 288 - ළමයින්ට සිගාකෑමට සැලැස්වීම හෝ කුට්ටනය කිරීම
- 288අ - ලිංගික සංසර්ගය සඳහා කුට්ටානියකු වශයෙන් ක්‍රියා කිරීමට ළමයින් කුලියට ගැනීම හෝ සේවයේ යෙදවීම
- 288ආ - සීමිත භාණ්ඩ ජාවාරම් කිරීමට ළමයින් කුලියට ගැනීම හෝ සේවයේ යෙදවීම
- 308අ - ළමයින් කෲරත්වයට භාජනය කිරීම
- 360අ - කුට්ටනය
- 360ආ - ළමයින්ගෙන් අයුතු ලිංගික ප්‍රයෝජන ගැනීම
- 360ඇ - තැනැත්තන් වෙළදාම් කිරීම
- 363 - ස්ත්‍රී දූෂණය
- 364අ - ව්‍යභිචාරය
- 365 - අස්වාභාවික වැරදි
- 365අ -තැනැත්තන් අතර දැඩි අශිෂ්ට ක්‍රියා
- 365ආ බරපතල ලිංගික අපයෝජනය

යන වැරදි ළමයකුට අදාලව සිදුකරන ලද විට “ළමා අපයෝජන” ලෙස සැලකේ. ළමයා යනු වයස අවුරුදු 18 කට අඩු තැනැත්තෙකි. ඒ අනුව දණ්ඩ නීති සංග්‍රහයේ ඉහත වගන්ති 13 යටතට ගැනෙන වැරදි සම්බන්ධව නීතිපති විසින් මහාධිකරණයේ අධිචෝදනා ගොනුකර ඇති නීතිකෘත්‍ය පිළිබදව තොරතුරු මෙහිවේ.

මෙහි මහජන ප්‍රදර්ශනය සඳහා ඉදිරිපත් කර ඇති ළමා අපයෝජන නීතිකෘත්‍ය පිළිබඳ සියලු තොරතුරු සහ ඒවා යාවත්කාලීන කිරීමට අදාල තොරතුරු පොලිස් ළමා හා කාන්තා අපයෝජන නිවාරණ දිසාව හරහා පොලිස් කොට්ටාස ළමා හා කාන්තා කාර්යාංශ 47 සම්බන්ධීකරණයෙන් සපයා ගන්න ලදී.

සභාපති

ජාතික ළමා ආරක්ෂක අධිකාරිය

| ළමා අපයෝජන නීති කෘත්‍ය | | | |
|---|---|---|---|
| අංකය | මහාධිකරණය | මුළු නඩු ගණන | 2026 මාර්තු කැදවීමට නියමිත නඩු |
| 1 | අම්පාර | 39 | 26 |
| 2 | අනුරාධපුර | 159 | 59 |
| 3 | අවිස්සාවේල්ල | 69 | 20 |
| 4 | බදුල්ල | 215 | 110 |
| 5 | බලපිටිය | 171 | 42 |
| 6 | මඩකලපුව | 4 | 1 |
| 7 | හලාවත | 145 | 55 |
| 8 | කොළඹ | 125 | 53 |
| 9 | ඇඹිලිපිටිය | 15 | 10 |
| 10 | ගාල්ල | 467 | 96 |
| 11 | ගම්පහ | 231 | 98 |
| 12 | හම්බන්තොට | 53 | 34 |
| 13 | හෝමාගම | 37 | 13 |
| 14 | යාපනය | 43 | 10 |
| 15 | කල්මුණේ | 1 | 0 |
| 16 | කළුතර | 241 | 64 |
| 17 | මහනුවර | 418 | 154 |
| 18 | කෑගල්ල | 203 | 50 |
| 19 | කිලිනොච්චිය | 35 | 22 |
| 20 | කුලියාපිටිය | 161 | 62 |
| 21 | කුරුණෑගල | 412 | 23 |
| 22 | මන්නාරම | 8 | 2 |
| 23 | මාතලේ | 83 | 27 |
| 24 | මාතර | 212 | 92 |
| 25 | මො ණ රාගල | 80 | 65 |
| 26 | මීගමුව | 198 | 57 |
| 27 | නුවරඑළිය | 82 | 38 |
| 28 | පානදුර | 39 | 13 |
| 29 | පොලොන්නරුව | 122 | 53 |

| | | | |
|---|---|---|---|
| **30** | පුත්තලම | 67 | 9 |
| **31** | රත්නපුර | 165 | 77 |
| **32** | තංගල්ල | 50 | 33 |
| **33** | ත්‍රිකුණාමලය | 28 | 17 |
| **34** | වව්නියාව | 43 | 9 |
| **35** | එකතුව | **4421** | **1494** |

සැලකිය යුතුය:

මෙහි දක්වා ඇත්තේ 2026.04.08 දිනට ලද තොරතුරු පමණි.